**රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව - 2021**

-----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලනකල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

----------------------------------------------------------------------------

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 1,020,783ක් වූ පරිත්‍යාග හා රු.1,164,131 ක් වූ ස්ථාවර තැන්පත් පොලී ආදායම, ප්‍රාග්ධන ආධාර හා වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට හිඟහිටි වෙනත් ආදායම් වලින් අඩුකර දක්වා තිබුණි. | පෙන්වාදී ඇති කරුණු නිවැරදි බව දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කලයුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී හිඟ වරිපනම් බදු ගිණුමේ ශේෂය නිවැරදි කිරිම සඳහා තනි සටහනක් මගින් කිසිදු අනුමැතියකින් තොරව ලැබිය යුතු වරිපනම් බදු රු.2,072,771 ක් කපා හැර තිබුණි. | කපා හැරීම සඳහා අනුමැතියට ඉදිරිපත්කර ඇති බව දන්වා තිබුණි | අනුමැතියකින් තොරව ලැබිය යුතු වරිපනම් බදු කපා හැරිය නොහැකි අතර ගිණුම් තැබීම නිවැරදිව කලයුතුය. |
| (ඇ) | පුස්තකාල පොත්වල වටිනාකම රු.338,437 ක් අඩුවෙන් දැක්වීම නිසා පුස්තකාල පොත් ගිණුම හා ප්‍රාග්ධනයෙන් ආදායමට දායකවීමේ ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | පෙන්වාදී ඇති කරුණු පිළිගනු ලබන බවත් 2022 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බවත් දන්වා තිබුණි | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කලයුතුය. |

1.6.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබානොගෙන මාසිකව අනුමත ඉන්ධන ලීටර් 500 ඉක්මවා 2012 අප්‍රේල් සිට 2020 සැප්තැම්බර් දක්වා ඉන්ධන ලීටර් 17,265.85 ක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ නිල රථය සඳහා යොදවා තිබුණි. මේ අනුව මුදල් රෙගුලාසි 156(i) අ(i) අනුව නිසි අධිකාරී බලය නොමැතිව සහ 156 (7) ට පටහැනිව ඉන්ධන සඳහා රු.1,898,611 ක් වියදම් දරා තිබුණි. මෙම මුදල් අයකර ගැනීම සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | සභාපතිතුමාගේ නිල රථය සඳහා අනුමත මාසික ඉන්ධන ප්‍රමාණය ලීටර් 750 දක්වා වැඩිකර ගැනීමට පළාත් විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගැනීම සඳහා යෝජනාවක් මහා සභාව මගින් ඒකමතිකව සම්මත කර ඇති බවත් විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමක් සිදුකර නොමැති බවත් දන්වා තිබුණි. | අනුමැතිය රහිතව ලබාගෙන ඇති ඉන්ධන සඳහා වැයවූ මුදල් අයකිරීමට කටයුතු කලයුතුය. |

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතුව රු. 80,168,825 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | පෙන්වාදී ඇති කරුණු පිළිගනු ලබන බවත් 2022 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී මෙය නිවැරදි කරන බවත් දන්වා තිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කර ගැනීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කලයුතුයි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 17,622,912 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,709,574 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වරිපනම් | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට රාජ්‍ය අංශයේ වරිපනම් ඒකක 24 කින් හා පෞද්ගලික අංශයට අයත් වරිපනම් ඒකක 2407කින් අයවිය යුතු වරිපනම් බදු ශේෂය රු. 5,053,359 ක් වූ අතර, මෙම ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වරිපනම් ලේඛනය දෝෂ සහිතව තිබීම නිසා හිඟ ශේෂයන් නිවැරදි නොවන බවත්, මෙම වර්ෂය අවසන් වීමට පෙර වරිපනම් ලේඛනය නිවැරදි කිරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කලයුතුය. |
| (ආ) කුලී | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට කඩ කාමර 129කින් අයවිය යුතු බදු කුලී ශේෂය රු. 11,801,918 ක් වූ අතර ඉන් රු.6,521,423 ක් සමාලෝචිත වර්ෂයටද, රු. 5,280,495 ක ශේෂය වර්ෂයකට වැඩි ශේෂද විය. | සියළුම බදුකරුවන් වෙත හිඟ මුදල් ගෙවන ලෙස ලිඛිතව දන්වා ඇති බවත්, මේ වන විට ආදායම් පරීක්ෂක මහතුන් මඟින් කඩිනමින් ආදායම් අයකරගැනීම සිදුකරමින් පවතින බවත් දන්වා තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කලයුතුය. |
| (ඇ) වෙනත් | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව පැවති පොදු වැසිකිලි ගාස්තු රු. 33,184 ක් හා දඩ ගාස්තු රු. 6,347,220 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට ආදායම් පරීක්ෂක මහතුන් මඟින් කඩිනමින් ආදායම් අයකරගැනීම සිදුකරමින් පවතින බවත් දන්වා තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කලයුතුයි. |

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

හදුනාගත් පාඩු

-----------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රුවන්වැල්ල නගර සංවර්ධනයට අදාලව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වෙළඳුන් 23 දෙනකුගේ රු.6.610,000 ක පෙරගෙවුම් මුදල් (Key Money) ලබාගෙන තිබුණු අතර බිම් මහලේ කඩකාමර 6 ක් වෙනුවෙන් රු.3,014,484 ක කොටස් ගෙවීම් 2ක් කර තිබියදී ඉඩමේ අයිතිය සම්බන්ධව පැවරූ නඩුවකට අදාලව ඉඩම් අත්පත්කර ගැනිම් පනතේ 38 වගන්තිය යටතේ අත්පත්කර ගැනීමට අදාල ගැසට්පත්‍රය හා පිඹුරේ සහතිකකල පිටපතක් සභාව විසින් අධිකරණය වෙත ඉදිරිපත් නොකිරීම මත ඉඩමේ අයිතිය පැමිණිලිකාර පාර්ශවයට හිමි වී තිබීමෙන් ඉදිකිරීමට දැරූ රු.4,819,144 ක මුදල ප්‍රාදේශීය සභාවට පාඩුවක් වී තිබුණු අතර, වෙළඳුන්ගෙන් ලබාගත් මුදල් වෙනුවෙන් ව්‍යාපාරික ස්ථාන ලබාදීමටද නොහැකි වී තිබුණි. එහෙත් මේ සඳහා වගකිවයුක්තන් නිශ්වය කර එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය කටයුතු කර දෙන ලෙස කෑගල්ල සහකාර පළාත් පාලන කොමසාරිස් මගින් ඉල්ලීමක් කර ඇති බවත්, ඒ අනුව ගනු ලබන ක්‍රියාමාර්ග විගණනය වෙත දන්වා එවීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | වගකිවයුක්තන් නිශ්වය කර සිදු වූ පාඩුව අයකර ගැනීමට කටයුතු කලයුතුය. |